# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන)

**1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ ඇතැම් නියමවලින් අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ තැනැත්තන් නිදහස් කිරීම සඳහා විශේෂ විධිවිධාන සැලැස්වීම පිණිස ද: ඊට සම්බන්ධ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.**

---

අධිකරණ අමාත්‍යතුමා විසින් 2013 ජුනි මස 06 වන දින ඉදිරිපත් කරන ලදී.

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

**[246 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 13 වන වගන්තියේ (1) වන උපවගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත උපවගන්තියේ නීතියේ බලපෑම වනුයේ, ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම සාධන පත්‍රයකම එම සාධන පත්‍රය බලපාන ඉඩම පිහිටි දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, පළාත් පාලන ආයතන බල ප්‍රදේශය, ග්‍රාම නිලධාරී කොට්ඨාශය සහ වෙනත් යම් කොට්ඨාශයක් ඇත්නම් එම කොට්ඨාශය ද පැහැදිළිව නිශ්චිතව දැක්විය යුතු බවට නියම කිරීම වේ.

## ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ
## (විශේෂ විධිවිධාන)

එල්.ඩී.—ඕ. 32/2013.

**1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ ඇතැම් නියමවලින් අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ තැනැත්තන් නිදහස් කිරීම සඳහා විශේෂ විධිවිධාන සැලැස්වීම පිණිස ද ඊට සම්බන්ධ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

මෑත අතීතයේ දී ශ්‍රී ලංකාවේ පැවැති සන්නද්ධ අරගලය හේතු කොටගෙන ඇතැම් තැනැත්තන් අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ බැවින් ද: පූර්විකාව.

අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ තැනැත්තන් එසේ අවතැන්වීමට පෙර ඔවුන්ගේ ස්ථිර වාසස්ථාන පිහිටි මැතිවරණ කොට්ඨාශවල දී ස්වකීය ඡන්ද බලය පාවිච්චි කිරීමට එසේ අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ තැනැත්තන්ට සහ ඔවුන්ගේ ඡන්දය දීමට සුදුසුකම්ලත් දරුවන්ට හැකි කරවීම පිණිස රජය විසින් ප්‍රතිපත්තියක් සකස් කර ඇති බැවින් ද:

එම ප්‍රතිපත්තිය බලාත්මක කිරීම සඳහා විශේෂ නෛතික විධිවිධාන සැලැස්වීමට දැන් අවශ්‍ය වී ඇති බැවින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2013 අංක       දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (1) 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද:— ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් ඇති අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ තැනැත්තන්.

(අ) අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ තැනැත්තකු වන්නා වූ ද;

(ආ) 2009 වර්ෂය අවසන් වන තෙක් වූ යම් වර්ෂයක් සඳහා උතුරු පළාතේ හෝ නැගෙනහිර පළාතේ යම් මැතිවරණ කොට්ඨාශයක් සඳහා වූ ඡන්ද හිමි නාම ලේඛනයක නම ඇතුළත් වන්නා වූ ද; සහ

(ඇ) 2009 වර්ෂයෙන් පසුව වලංගුව පැවති කවර හෝ නාම ලේඛනයක තමාගේ නම ඇතුළත් කරනු ලැබ නොමැති වූ ද,

2—PL 007293—350 (2013/06)

ශ්‍රී ලංකාවේ ඕනෑම පුරවැසියකුට ඉහත (අ), (ආ) සහ (ඇ) යන ඡේදවල නිශ්චිතව දැක්වෙන කරුණු ඔප්පු කරනු ලැබීම මත සහ ඔහු අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ තැනැත්තකු බවට ඔහු දැනට පදිංචිව සිටින ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කිරීම මත, 2009 මැයි මස 18 වන දිනයට පෙර තමා ස්ථිරව පදිංචි වී සිටි මැතිවරණ කොට්ඨාශයේ ඡන්ද හිමි නාම ලේඛනයෙහි ලියාපදිංචි කරනු ලැබීම සඳහා එම මැතිවරණ කොට්ඨාශයේ ලියාපදිංචි කිරීමේ නිලධරයා වෙත ඉල්ලීමක් කිරීමට හිමිකම ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ඉල්ලීම, මැතිවරණ කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන දැන්වීමක් මගින් නිශ්චිතව සඳහන් කරනු ලබන දිනයක දී හෝ එදිනට පෙර කරනු ලැබිය යුතු ය.

(3) 1 වන උපවගන්තියේ කුමක් සඳහන් වුව ද, ඒ උපවගන්තියේ සඳහන් පුරවැසියකුගේ—

(අ) එම පුරවැසියා අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ තැනැත්තකු බවට පත් වූ දිනයේ දී වයස අවුරුදු දහ අටට එළඹ නොසිටියා වූ ද;

(ආ) එම පුරවැසියා අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ තැනැත්තකු බවට පත්වීමෙන් පසුව ඉපදී, මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයේ දී වයස අවුරුදු දහ අට හෝ ඊට වැඩි වයසකට එළඹ ඇත්තා වූ ද; සහ

(ඇ) 2009 වර්ෂයෙන් පසුව වලංගුව පැවති කවර හෝ නාම ලේඛනයක තමාගේ නම ඇතුළත් කරනු ලැබ නොමැති වූ ද,

දරුවන්ට, ලියාපදිංචි කිරීමට අපේක්ෂිත දරුවාගේ උප්පැන්න සහතිකය සහ ඔහු පදිංචිව සිටින ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී විසින් ඉහත (අ) හෝ (ආ) සහ (ඇ) කරුණු සනාථ කරමින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කිරීම මත, ඒ උපවගන්තියේ ප්‍රදානය කරනු ලැබූ හිමිකම ව්‍යාප්ත කරනු ලැබිය යුතු ය.

හිමිකම් පෑම් ලැයිස්තුව.

3. (1) 2 වන වගන්තියේ සඳහන් තැනැත්තන්ගේ නම් ලැයිස්තුවක් ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් පිළියෙළ කරනු ලැබිය යුතු අතර, එම ලැයිස්තුව සම්පූර්ණ කර ඇති බවට සහ දවසේ සියලු යුක්තිසහගත වේලාවන් තුළ දී එම ලැයිස්තුව පරීක්ෂා කිරීම සඳහා ලියාපදිංචි කිරීමේ නිලධරයාගේ කාර්යාලයේ තබා ඇති බවට, සඳහන් කරමින් ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් ගැසට් පත්‍රයේ සහ සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ යන එක් එක් භාෂාවලින් පළවන යටත් පිරිසෙයින් එක් පුවත් පතකවත් දැන්වීමක් පළ කළ යුතු ය.

(2) (අ) උතුරු පළාතේ හෝ නැගෙනහිර පළාතේ යම් මැතිවරණ කොට්ඨාශයක් සඳහා වූ යම් ඡන්ද හිමි නාම ලේඛනයක ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කර ඇත්තා වූ ද, (1) වන උපවගන්තියේ සඳහන් ලැයිස්තුවේ තමාගේ නම ඇතුළත් කර නොමැති වූ ද, යම් තැනැත්තකු විසින් ගැසට් පත්‍රයේ පළ වූ දැන්වීමේ දින සිට සති එකක් ඇතුළත ලියාපදිංචි කිරීමේ නිලධරයා වෙත ලිඛිතව අභියාචනය කළ හැකි ය.

(අ) ලියාපදිංචි කිරීමේ නිලධරයාගේ තීරණවලට එරෙහිව වූ අභියාචන සම්බන්ධයෙන් 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 14 වන වගන්තියේ (8) වන උපවගන්තියේ සිට (16) වන උපවගන්තිය දක්වා වූ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(ඇ) අභියාචනය කිරීමෙන් පසුව සහ පරීක්ෂණයෙන් පසුව 4 වන වගන්තියේ සඳහන් පරිපූරක නාම ලේඛනයෙහි එම ඉල්ලුම්කරුගේ නම ඇතුළත් නොකිරීමට ලියාපදිංචි කිරීමේ නිලධරයා තීරණය කළහොත් ලියාපදිංචි කිරීමේ නිලධරයාගේ තීරණයේ දින සිට සති එකක් ඇතුළත අතෘප්තියට පත් අභියාචක විසින් ප්‍රතිශෝධනය කිරීමේ නිලධරයා වෙත අභියාචනය කළ හැකි ය. තව ද, මේ ඡේදය යටතේ කරනු ලබන අභියාචනවලට 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 15 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සිට (5) වන උපවගන්තිය දක්වා වූ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීමේ සහතිව, අදාළ විය යුතු ය.

පරිපූරක නාම ලේඛනය.

4. පරීක්ෂණයක් සහ තීරණය කිරීමක් අවශ්‍ය වුවහොත් එම තීරණය කිරීම සිදු කිරීමෙන් පසු 3 වන වගන්තිය යටතේ පිළියෙළ

කරන ලද ලැයිස්තුවෙහි නම් ඇතුළත් වන තැනැත්තන්ගේ නම් ඇතුළත් වන පරිපූරක නාම ලේඛනයක් එක් එක් මැතිවරණ කොට්ඨාශයේ ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් පිළියෙල කර සහතික කළ යුතු අතර, 3 වන වගන්තිය ප්‍රකාරව අවසන් කළ යුතු ය:

එසේ වුව ද, ප්‍රතිශෝධනය කිරීමේ නිලධරයා වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයක් අවසන් නොවී පවතින කාලය තුළ දී ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් පරිපූරක නාම ලේඛනය සහතික කරනු ලැබිය හැකි අතර, ඉන්පසු එම අභියාචනය පිළිබඳව කරනු ලබන තීරණය මත ප්‍රතිශෝධනය කිරීමේ නිලධරයාගේ තීරණයට අනුකූලව ලියාපදිංචි කිරීමේ නිලධරයා විසින් යම් තැනැත්තකුගේ නම එම නාම ලේඛනයට ඇතුළත් කිරීම හෝ එම නාම ලේඛනයෙන් ඉවත් කිරීම හෝ කරනු ලැබිය යුතු ය.

වැරදි.

**5.** (1) යම් තැනැත්තකුට ඡන්ද හිමි නාම ලේඛන දෙකක හෝ ඊට වැඩි ගණනක ඔහුගේ නම ඇතුළත් කරවා ගැනීමට සුදුසුකම් තිබුණ ද, එය නොතකා, පරිපූරක නාම ලේඛනයේ නම ඇතුළත්ව ඇති එම තැනැත්තාට වෙනත් යම් ඡන්ද හිමි නාම ලේඛනයකට ඔහුගේ නම ඇතුළත් කරවා ගැනීමට හිමිකමක් නොමැත්තේ ය.

(2) යම් ඡන්ද හිමි නාම ලේඛනයක එක් වරකට වැඩි වාර ගණනක් නම ඇතුළත් කරවා ගැනීමට යම් තැනැත්තකුට සුදුසුකම් තිබුණ ද, එය නොතකා එකම ඡන්ද හිමි නාම ලේඛනයේ එක් වරකට වැඩි වාර ගණනක් ඔහුගේ නම ඇතුළත් කරවා ගැනීමට කිසිම තැනැත්තකුට හිමිකමක් නොමැත්තේ ය.

(3) මේ පනතේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, පරිපූරක නාම ලේඛනයෙහි තමාගේ නම සඳහන්ව ඇති යම් තැනැත්තකුගේ නම වෙනත් යම් ඡන්ද හිමි නාම ලේඛනයක ඇතුළත්ව ඇත්නම් සහ එම තැනැත්තා විසින් මැතිවරණ කොට්ඨාශ දෙකක හෝ ඊට වැඩි ගණනක දී තම ඡන්දය පාවිච්චි කරයි නම්, ඔහු වරදකට වරදකරු වන අතර එසේ වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු දෙකක කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ එම තැනැත්තා යටත් වන්නේ ය.

(4) මේ පනතේ සඳහන් යම් කාර්යයක් සඳහා අසත්‍ය තොරතුරු හෝ ව්‍යාජ ලේඛන ඉදිරිපත් කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු එකක කාලයක්

සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම හෝ එම තැනැත්තා යටත් වන්නේ ය.

පනත ක්‍රියාත්මක වීමේ කාල සීමාව සහ එම කාලසීමාව දීර්ඝ කිරීම.

**6.** (1) මෙම පනතේ විධිවිධාන මෙම පනත ක්‍රියත්මක වීම ආරම්භවන දින සිට අවුරුදු දෙකක කාල සීමාවක් සඳහා ක්‍රියාත්මකව පවතින්නේ ය.

(2) මේ පනත ක්‍රියාත්මක වන කාලසීමාව අවසන් වීමට මාස එකකට පෙරාතුව වූ යම් වේලාවක් ඇතුළත, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් පනත ක්‍රියාත්මක වීම තවදුරටත් වූ කාලයක් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි නමුත්, එවැනි යම් දීර්ඝ කිරීමක සම්පූර්ණ කාලසීමාව එසේ ප්‍රදානය කරන ලද දීර්ඝ කිරීමේ දින සිට අවුරුදු දෙකක් නොඉක්මවිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියමයක් ම අමාත්‍යවරයා විසින් එයට අත්සන් තැබීමෙන් පසු සහ එම සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසුව ක්‍රියාත්මක වන්නේ ය.

(4) (3) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම, එම නියෝගය ගැසට් පත්‍රයේ පළ කිරීමේ දින සිට මාස තුනක කාලයක් ඇතුළත් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) පාර්ලිමේන්තුව විසින් එම නියෝගය අනුමත කිරීමේ දිනය නිශ්චිතව දක්වමින් නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**7.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථනිරූපණය.

**8.** මේ පනතෙහි-

"මැතිවරණ කොමසාරිස්වරයා" යන්නට, 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ ඇති අර්ථය ම තිබිය යුතු ය.

"අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ තැනැත්තා" යන්නෙන්, උතුරු පළාතේ හෝ නැගෙනහිර පළාතේ ස්ථිර වශයෙන් පදිංචි වී සිටියා වූ ද, 2009 මැයි මස 18 වන දිනයට පෙරාතුව කවර හෝ අවස්ථාවක දී ශ්‍රී ලංකාවේ පැවැති සන්නද්ධ අරගලයේ ප්‍රතිඵලයක් ලෙස ඔහුගේ පදිංචි ස්ථානය හැරයාමට සිදු වූ හෝ හේතු වූ ද, දැනට උතුරු පළාතේ හෝ නැගෙනහිර පළාතේ තම මුල් පදිංචි ස්ථානයෙන් පිටත ශ්‍රී ලංකාව තුළ පදිංචි වී සිටින්නා වූ ද, ශ්‍රී ලංකාවේ පුරවැසියකු අදහස් වේ;

"ලියාපදිංචි කිරීමේ නිලධරයා" යන්නට, 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ ඇති අර්ථය ම තිබිය යුතු ය;

"වලංගුව පැවති නාම ලේඛනය" යන්නට, 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ ඇති අර්ථය තිබිය යුතු ය;

"ප්‍රතිශෝධනය කිරීමේ නිලධරයා" යන්නට, 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ ඇති අර්ථය ම තිබිය යුතු ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 122 වන ව්‍යවස්ථාව යටතේ සහතිකය

ඉහත දැක්වෙන පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලයේ අදහස අනුව ජාතියේ හිත පිණිස වහා අවශ්‍ය වන්නා වූ පනත් කෙටුම්පතක් බවට මෙයින් සහතික කරමි.

**එස්. අබේසිංහ,**
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්

2013 මැයි මස 26 දින.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.